# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,115 - 2019 මාර්තු මස 15 වැනි සිකුරාදා - 2019.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 726 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 736 |

*සැ. යු.*-(i) පොල් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත 2019 පෙබරවාරි මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත 2019 පෙබරවාරි මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 අප්‍රේල් මස 05 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 මාර්තු මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

723 B 81504— 5,403 (2019/03)
B-1

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සැම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඊ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව**

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ නිලධාරීන් විශේෂඥ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම**

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ විශේෂඥ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අංක 924/2 දරන 1996 මැයි 20 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා ඊට වරින් වර කරන ලද සංශෝධන ප්‍රකාරව පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති රේඛීය අමාත්‍යාංශයට අයත් ආයතනවල/ පළාත් සභා ආයතනවල/ පළාත් පාලන ආයතනවල සේවයේ නියුතු ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *විශේෂඥ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අදාල සුදුසුකම්* :

I. ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධර ගණය :

(*අ*) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධර ගණයේ II වන ශ්‍රේණියේ හෝ ඉන් ඉහළ ශ්‍රේණියක වෛද්‍ය නිලධරයෙකු වීම,

සහ

(*ආ*) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ III පරිශිෂ්ඨයේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා රජය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය/ විදේශීය විශ්ව විද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා රජය පිළිගත් පශ්චාත් උපාධි ආයතනයකින් පශ්චාත් උපාධි සහතිකයක් ලබා තිබීම,

සහ

(*ඇ*) පශ්චාත් උපාධිය සමත් වූ පසු ආයුර්වේද රෝහලක, මධ්‍යම බෙහෙත් ශාලාවක, නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවක, රජය පිළිගත් ආයුර්වේද පර්යේෂණායතනයක, රජය පිළිගත් ආයුර්වේද අධ්‍යාපන ආයතනයක හෝ ආයුර්වේද ක්ෂේත්‍රයේ කළමනාකරණය හා පරිපාලන ආයතනයක කටයුතු කිරීමේදී තමන්ගේ නිශ්චිත අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ වසර දෙකක (02) සක්‍රීය සේවා කාලය තුළ වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම සහ එම පළපුරුද්ද ජ්‍යෙෂ්ඨ විශේෂඥ වෛද්‍යවරයෙකුගේ හෝ ආයතන ප්‍රධානියාගේ නිර්දේශ මත ආයුර්වේද කොමසාරිස් / පළාත් ආයුර්වේද කොමසාරිස් විසින් සහතික කර තිබීම.

II. ආයුර්වේද පර්යේෂණායතනයේ වෛද්‍ය නිලධර (පර්යේෂණ) ගණය :

(*අ*) ආයුර්වේද පර්යේෂණායතනයේ වෛද්‍ය නිලධර (පර්යේෂණ) ගණයේ II වන ශ්‍රේණියේ හෝ ඉන් ඉහළ ශ්‍රේණියක වෛද්‍ය නිලධරයෙකු වීම,

සහ

(*ආ*) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ III පරිශිෂ්ඨයේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා රජය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය / විදේශීය විශ්ව විද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා රජය පිළිගත් පශ්චාත් උපාධි ආයතනයකින් පශ්චාත් උපාධි සහතිකයක් ලබා තිබීම,

සහ

(*ඇ*) පශ්චාත් උපාධිය සමත් වූ පසු ආයුර්වේද රෝහලක, මධ්‍යම බෙහෙත් ශාලාවක, නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවක, රජය පිළිගත් ආයුර්වේද පර්යේෂණායතනයක, රජය පිළිගත් ආයුර්වේද අධ්‍යාපන ආයතනයක හෝ ආයුර්වේද ක්ෂේත්‍රයේ කළමනාකරණය හා පරිපාලන ආයතනයක කටයුතු කිරීමේදී තමන්ගේ නිශ්චිත අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ වසර දෙකක (02) සක්‍රීය සේවා කාලය තුළ වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම සහ එම පළපුරුද්ද ජ්‍යෙෂ්ඨ විශේෂඥ වෛද්‍යවරයෙකුගේ හෝ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය මත ආයුර්වේද කොමසාරිස් / පළාත් ආයුර්වේද කොමසාරිස් විසින් සහතික කර තිබීම.

III. දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ වෛද්‍ය නිලධර (අධ්‍යාපන) ගණය :

(*අ*) දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ වෛද්‍ය නිලධර (අධ්‍යාපන) ගණයේ II ශ්‍රේණියේ හෝ ඉන් ඉහළ ශ්‍රේණියක වෛද්‍ය නිලධරයෙකු වීම,

සහ

(*ආ*) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ III පරිශිෂ්ඨයේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා රජය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් දේශීය / විදේශීය විශ්ව විද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා රජය පිළිගත් පශ්චාත් උපාධි ආයතනයකින් පශ්චාත් උපාධි සහතිකයක් ලබා තිබීම,

සහ

(*ඇ*) පශ්චාත් උපාධිය සමත් වූ පසු ආයුර්වේද රෝහලක, මධ්‍යම බෙහෙත් ශාලාවක, නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවක, රජය පිළිගත් ආයුර්වේද පර්යේෂණායතනයක, රජය පිළිගත් ආයුර්වේද අධ්‍යාපන ආයතනයක හෝ ආයුර්වේද ක්ෂේත්‍රයේ කළමනාකරණය හා පරිපාලන ආයතනයක කටයුතු කිරීමේදී තමන්ගේ නිශ්චිත

අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ වසර දෙකක (02) සක්‍රීය සේවා කාලය තුළ වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම සහ එම පළපුරුද්ද ජ්‍යෙෂ්ඨ විශේෂඥ වෛද්‍යවරයෙකුගේ හෝ ආයතන ප්‍රධානියාගේ නිර්දේශ මත ආයුර්වේද කොමසාරිස්/පළාත් ආයුර්වේද කොමසාරිස් විසින් සහතික කර තිබීම,

IV. I (ඇ) II (ඇ) සහ III (ඇ) හි සඳහන් සුදුසුකම් සනාථ කිරීම සඳහා අධ්‍යාපනික හා වෘත්තීය පළපුරුද්ද සම්බන්ධ සහතික හා ලේඛන සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

02. 2018.02.28 දිනට පවත්නා පුරප්පාඩු සංඛ්‍යා :

| *පුරප්පාඩු* | *සංඛ්‍යාව* |
|---|---|
| මධ්‍යම රජය | 10 |
| බස්නාහිර පළාත | 10 |
| මධ්‍යම පළාත | 08 |
| දකුණු පළාත | 10 |
| ඌව පළාත | 08 |
| සබරගමු පළාත | 10 |
| වයඹ පළාත | 07 |
| උතුරු මැද පළාත | 07 |
| නැගෙනහිර පළාත | 10 |
| උතුරු පළාත | 08 |
| | 88 |

*සටහන.-* විශ්‍රාම ගන්නා අවස්ථාවේදී ඉහත සුදුසුකම් සපුරා තිබූ ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ට ද මේ සඳහා ඉල්ලුම් කළ හැක.

03. ඉහත සඳහන් පරිදි සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් මේ සමඟ දැක්වෙන ආකෘතිය ප්‍රකාරව (අයදුම්පත www.ayurveda.gov.lk ඔස්සේද ලබාගත හැක.) සකස් කරන ලද අයදුම්පතක් මගින් 2019 අප්‍රේල් මස 05 වැනි දිනට පෙර ආයතන ප්‍රධානියා මගින්ද, දැනට විශ්‍රාම ලබා ඇති ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් පෞද්ගලිකව ද, "ආයුර්වේද කොමසාරිස්, ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න, මහරගම" වෙත ලැබෙන සේ අයදුම්පත යොමුකළ යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ නිලධාරීන් විශේෂඥ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

04. විශේෂඥ ශ්‍රේණියේ තනතුරක ආරම්භක වැටුප් පියවර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 ට අනුව SL-3-2006 ට අදළ (රු. 42,390 - 12x1,310-58,110) වන අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 ට අනුව SL-3-2016 ට අදළ (රු. 88,000 - 12 x 2700 - 120,400) වේ.

05. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ විශේෂඥ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයට අදළ ලකුණු දීමේ පරිපාටිය පහත පරිදි වේ. :

1. *සේවා කාලය* : **(උපරිම ලකුණු 50)**

ආයුර්වේද වෛද්‍ය සේවයේ II ශ්‍රේණියේ සේවා කාලය (සෑම වසරක් සඳහාම ලකුණු 02 බැගින්) — ලකුණු 20

ආයුර්වේද වෛද්‍ය සේවයේ I ශ්‍රේණියේ සේවා කාලය (සෑම වසරක් සඳහාම ලකුණු 05 බැගින්) — ලකුණු 05 බැගින් 30

2. *පළපුරුද්ද* : **(උපරිම ලකුණු 20)**

පශ්චාත් උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු වසර දෙකක පූර්ණ කාලීන සායනික / පර්යේෂණ පුහුණුවෙන් පසුව එළඹෙන සෑම වසරක් සඳහාම අදළ සායනික පර්යේෂණ ක්ෂේත්‍රයෙහි සේවය කිරීම වෙනුවෙන් ලකුණු 02 බැගින්

3. *ක්ෂේත්‍රයට අදල අමතර අධ්‍යාපන හෝ වෘත්තීය සුදුසුකම්* : **(උපරිම ලකුණු 20)**

i. අධ්‍යාපන සුදුසුකම් :

| | | |
|---|---|---|
| දර්ශනපති (Ph.D) | - | ලකුණු 10 |
| දර්ශනවේදී (M.Phil) | - | ලකුණු 08 |
| විද්‍යාපති (MSc) | - | ලකුණු 06 |

ii. පර්යේෂණ සහ ප්‍රකාශන :

අදළ ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ ප්‍රකාශන සඳහා - ලකුණු 10

(අදළ ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර මට්ටමේ එක් පර්යේෂණයක් සහ ප්‍රකාශනයක් සඳහා (ලකුණු 10 බැගින්)

(අදළ ක්ෂේත්‍රයේ ජාතික මට්ටමේ එක් පර්යේෂණයක් සහ ප්‍රකාශන ග්‍රන්ථයක් සඳහා (ලකුණු 05 බැගින්)

*සටහන.-* පර්යේෂණ සහ ප්‍රකාශන ඇගයීමේදී ඇමුණුම 1 හි සඳහන් නිර්ණායක පදනම් කරගනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණය : **(උපරිම ලකුණු 10)**

4. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය හා විවිධ රෝග පිළිබඳ විශේෂ දැනුම සඳහා

**(මුළු ලකුණු 100)**

*තෝරා ගන්නා ක්‍රමය* :

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන්ගේ අධ්‍යාපන, වෘත්තීය, සේවා පළපුරුද්ද හා ජ්‍යෙෂ්ඨතාවය සම්බන්ධ සහතික හා ලේඛණ පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉහත සඳහන් ලකුණු ලබාදීමේ පටිපාටිය අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්, පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව මඟින් විශේෂඥ ශ්‍රේණියට උසස් කිරීමට කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි,

වසන්තා පෙරේරා,
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2019 මාර්තු මස 07 වැනි දින,

ඇමුණුම - 1

**ප්‍රකාශන ඇගයීම සඳහා අදාල කර ගත යුතු නිර්ණායක**

i. ප්‍රකාශන :

(අ) ජර්නල් පත්‍රිකා - සමාලෝචනයට ලක් කර ඇති අංකිත ප්‍රකාශන මාලාවක පලකරන ලද ශාස්ත්‍රීය වැදගත්කමක් සහිත සම්පූර්ණ පිටපතක් සහිත රචනයක් හෝ ලිපියක්.

(ආ) සමුළු පත්‍රිකා / උද්ධෘත / අවසන් වශයෙන් පිටපත් කරන ලද රචනා-

ශාස්ත්‍රීය වටිනාකමක් සහිත සම්මේලන, සභාවක්, සම්මන්ත්‍රණ, අධ්‍යාපන සම්මේලන, සංවාද මණ්ඩප, වැඩමුළු හෝ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ සඳහා යොදගත් වාර්තා

ii. කර්තෘන් කිහිපදෙනෙකුගේ සහාභාගීත්වයෙන් පළකරන ලද ප්‍රකාශන සම්බන්ධයෙන් අයදුම්කරුගේ දයකත්ව ප්‍රමාණය පැහැදිලිව දක්වා තිබිය යුතු අතර, එම දයකත්ව ප්‍රමාණයට සමානුපාතිකව අයදුම්කරුට ලකුණු ලබා දෙනු ලැබේ.

iii. එකම දත්ත / පර්යේෂණ තොරතුරු මත පදනම්ව පළකරනු ලබන, බොහෝ දුරට සමාන නිගමනයන්ට එළැඹී ඇති ප්‍රකාශන වෙන් වෙන් ප්‍රකාශන වශයෙන් සලකා බලනු නොලැබේ. එවැනි අවස්ථාවකදී ලකුණු ලබා දීම සඳහා එක් ප්‍රකාශනයක් පමණක් සලකා බලනු ලැබේ.

ආදර්ශ අයදුම්පත්‍රය

**ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ විශේෂඥ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත**

1. මුලකුරු සමඟ නම :————.
2. සම්පූර්ණ නම :————.
3. උපන් දින :————.
4. ජාතික හැඳුනුම්පත් අංකය :————.
5. දුරකථන අංකය :————.
6. සේවා ස්ථානයේ ලිපිනය :————.
7. a). මුල් පත්වීමේ දිනය :————.
   b). වර්තමාන ශ්‍රේණිය :————.
   c). II ශ්‍රේණියට පත් වූ දිනය :————.
   d). II ශ්‍රේණියේ සේවා කාලය(අවුරුදු) :————.
   e). I ශ්‍රේණියට පත් වූ දිනය :————.
   f). I ශ්‍රේණියේ සේවා කාලය(අවුරුදු) :————.

8. ලබා ඇති පශ්චාත් උපාධි සුදුසුකම් :————.
(ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය අනුව)

| *ආයතනය* | *පාඨමාලාවේ නම* | *කාලය* | *සම්පූර්ණ කළ දිනය (පුහුණු කාලය ඇතුළත්ව)* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

9. ලබා ඇති පශ්චාත් උපාධි ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ II/III පරිශිෂ්ඨයට අනුව කුමන විෂය ධාරාවට අයත් වන්නේද යන වග ඃ

..........................................................................................................
..........................................................................................................

මවිසින් ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

*ආයතන ප්‍රධානියාගේ නිර්දේශය*

........................................................................................ මයා/මිය/මෙනවිය විසින් ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත මේ සමඟ ඉදිරිපත් කරනු ලබන අතර, එහි සඳහන් තොරතුරු නිවැරදි බවත්, පූර්වාසන්න වසර 05 තුළ නිලධාරියාට/නිලධාරිනියට විරුද්ධව විනය ක්‍රියාමාර්ගයක් ගෙන ඇති*/නොමැති බවත් සහතික කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව

දිනය :————.

*විනය ක්‍රියාමාර්ගයක් ගෙන ඇතිනම් ඒ පිළිබඳව සඳහන් කළ යුතුය.

*ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත් සහ අසම්පූර්ණ ඉල්ලුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03-1236

## අධ්‍යාපන අමාත්‍යාංශය

### දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල සිංහල හා දෙමළ මාධ්‍යය පාසල් ශිෂ්‍ය උපදේශන කාර්යය සඳහා අධ්‍යාපනවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම - 2019

දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍යය පාසල් ශිෂ්‍ය උපදේශන කාර්යය සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට අධ්‍යාපනවේදී උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2019.04.12 දිනට හෝ ඊට පෙර "සහකාර ලේකම්, ගුරු ආයතන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ" දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍යය පාසල් ශිෂ්‍ය උපදේශන කාර්යය සඳහා අධ්‍යාපනවේදී උපාධිධාරීන් බඳවා ගැනීම - 2019" ලෙස අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

*සටහන 1* :- අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි ප්‍රතිවිපාක අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය. තව ද අයදුම්පතෙහි මාතෘකාව සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

02. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :

2.1 අයදුම්කරුවන් මෙම නිවේදනයේ 5.1 හි සඳහන් සුදුසුකම් සමග 5.2 හි සඳහන් සුදුසුකම් සපුරා තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙහි සඳහන් සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූවන් වෘත්තියේ දී වැදගත්වන ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳව කුසලතාවය මැන බැලීම සඳහා මෙම ගැසට් නිවේදනයේ 9.2 වගන්තිය අනුව ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කරනු ඇත. අයදුම්කරු විසින් ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගන්නා මුළු ලකුණුවල ප්‍රමුඛතාවය මත පාසල් පාදක ක්‍රමය පදනම් කරගෙන පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

2.3 ප්‍රායෝගික පරීක්ෂණ අවස්ථාවේ දී අයදුම්කරුවන්ට අදාළ පුරප්පාඩු ලේඛනය ප්‍රදර්ශනය කරනු ලැබේ. ඒ අනුව අයදුම්කරුවන් විසින් එම අවස්ථාවේ දී පුරප්පාඩු පවතින පාසල සඳහා ස්වකීය පත්වීම් ලබා ගැනීමට ඇති මනාපය අනුපිළිවෙලින් දැක්විය යුතුය.

*සටහන 2* - එකම පාසලට ඉල්ලා ඇති අයදුම්කරුවන් කිහිප දෙනෙකු සිටින අවස්ථාවක දී අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරන ලද නිශ්චිත ලකුණු ලබාදීමේ පරිපාටියකට අනුව සුදුසු අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

2.4 මෙම පුරප්පාඩු සඳහා බඳවා ගනු ලබන්නේ පාසල් පාදක ක්‍රමය පදනම් කර ගෙන වන බැවින් වසර 05 ක් ගත වනතුරු කිසිදු අයුරකින් ස්ථාන මාරුවීම් ලබා දෙනු නොලැබේ.

2.5 පවතින පුරප්පාඩු :

| *පළාත* | *ජාතික පාසල්* | | *පළාත් පාසල්* | |
|---|---|---|---|---|
| | *සිංහල මාධ්‍ය* | *දෙමළ මාධ්‍ය* | *සිංහල මාධ්‍ය* | *දෙමළ මාධ්‍ය* |
| බස්නාහිර | ✓ | ✓ | _ | _ |
| මධ්‍යම | ✓ | ✓ | ✓ | ✓ |
| දකුණ | ✓ | ✓ | _ | _ |
| උතුර | ✓ | ✓ | _ | _ |

| *පළාත* | *ජාතික පාසල්* | | *පළාත් පාසල්* | |
|---|---|---|---|---|
| | *සිංහල මාධ්‍ය* | *දෙමළ මාධ්‍ය* | *සිංහල මාධ්‍ය* | *දෙමළ මාධ්‍ය* |
| නැගෙනහිර | ✓ | ✓ | _ | _ |
| වයඹ | ✓ | ✓ | ✓ | ✓ |
| උතුරු මැද | ✓ | _ | _ | _ |
| සබරගමුව | ✓ | _ | ✓ | ✓ |
| ඌව | ✓ | ✓ | _ | _ |

*සටහන 3* :- පළාත් සහා පාසල් සඳහා අයදුම්කරන්නන් එම පළාතේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවිනතාව ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

(v) 2014.10.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානයන්ට ද එම සේවා ව්‍යවස්ථාවට මින් මතුවට සිදු කරනු ලබන සංශෝධනයන්ට ද රාජ්‍ය සේවයේ පත්වීම් වලට අදාළ පොදු කොන්දේසිවලට ද මෙම පත්වීම යටත් වනු ඇත.

04. *වැටුප් පරිමාණය* :
මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව G -E-02-2016 හි රු. 33,300 - 495 x 5 - 680 x 5- 825 x 7 - 1,335 x 20 - රු. 71,650 (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. ඔවුන් මෙම වැටුප් පරිමාණයෙහි 3 වන පියවර වන රු. 34,290 හි පිහිටුවනු ලැබේ. වැටුප් ගෙවීම සිදු කරනු ලබන්නේ එම චක්‍රලේඛයේ II උපලේඛනයේ සඳහන් විධිවිධාන අනුව වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාවන් ද ඔබට හිමිය.

05. *අධ්‍යාපන සුදුසුකම්* :

5.1 ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව හා අංක අමප/17/0653/742/009 හා 2017.05.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2019.04.12 දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

5.2 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයකින් ලබා ගත් උපදේශනය/සමාජ විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති අධ්‍යාපනවේදී උපාධියක්;

සහ

5.3 ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයයක් වශයෙන් සමත් වී තිබිය යුතුය.

*සටහන 4* : - විභාග කොමසාරිස් ජනරාල් විසින් දේශීය අ.පො.ස. (සා. පෙළ.) විභාගය හා සමානව පිළිගනු ලබන විභාග සමතුන්ට ද ඉල්ලුම් කළ හැකිය.

06. *වයස් සීමාව* :
2019.04.12 දිනට වයස
අවම සීමාව : අවුරුදු 18
උපරිම සීමාව : අවුරුදු 35

ඒ අනුව, 2001.04.12 හෝ ඊට පෙර හා 1984.04.12 දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

07. *අනෙකුත් අවශ්‍යතා :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.
(iv) සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

08. *අයදුම්කිරීමේ ක්‍රමය :*

8.1 අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර එය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් සකස් කර අයදුම්කරු විසින් ම පිරවිය යුතුය. 1.0 සිට 5.5 තෙක් වන ශීර්ෂ පළමුවන පිටුවේ ද 6.0 සිට ශීර්ෂ අනිකුත් පිටු වලට ද ඇතුළත් වන පරිදි තම අයදුම්පත සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් ද, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් ද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) සම්පූර්ණ කරනු ලබන අයදුම්පත *ගැසට්* නිවේදනයේ දැක්වෙන අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකිය.

8.2 එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

8.3 අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු හෝ රු. 240,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

8.4 පුරප්පාඩුව සඳහා ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය කිසිසේත් වෙනස් කරනු නොලබන අතර ඒ පිළිබඳව ඉදිරිපත් කරන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලැබේ.

8.5 ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අයදුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාදවීම හෝ ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. එමෙන්ම අයදුම්පත් ලැබී ඇති බව දන්වනු නොලැබේ.

09. *සම්මුඛ පරීක්ෂණය :*

9.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :
සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

***සටහන 5.-*** ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු—

සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන මෙම නිවේදනයේ හෝ පුවත්පත් දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේද'යි පරීක්ෂා කිරීම සහ කායික සුදුසුකම් පරීක්ෂා කිරීම.

9.2 ප්‍රායෝගික පරීක්ෂණය :
අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ අයදුම්කරු හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ විනාඩි 05කට නොඅඩු කාලයක ඉදිරිපත් කිරීමක් කළ යුතුය. උපරිම ලකුණු 25ක් හිමිවන අතර ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීමට පහත සඳහන් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබා ගත යුතුය.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිශ්‍යවීම | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | 25 | 10 |

***සටහන 6.***- ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු -
ගුරු වෘත්තියේ දී වැදගත්වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාව මැන බැලීම.

10. *අයදුම්පත පිරවීම සඳහා උපදෙස්* :

අයදුම්පත පිරවීමේ දී පහත උපලේඛන 01, 02 හා 03 පමණක් භාවිතා කරන්න.

උපලේඛනය 01

| භාෂා මාධ්‍යය | කේත අංකය |
|---|---|
| සිංහල මාධ්‍යය | 2 |
| දෙමළ මාධ්‍යය | 3 |

උපලේඛනය 02

| පාසල් වර්ගය | කේත අංකය |
|---|---|
| ජාතික | 1 |
| පළාත් | 2 |

උපලේඛනය 03

| පළාත | කේත අංකය |
|---|---|
| මධ්‍යම පළාත | 2 |
| වයඹ පළාත | 6 |
| සබරගමුව පළාත | 9 |

11. දැනට රජයේ සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පත්‍රයේ අංක 9.0 ශීර්ෂය යටතේ තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කරන ලද අයදුම්පත් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

12. සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේ දී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ.

13. එමෙන් ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතික ඉදිරිපත් කළ යුතු වන අතර පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් බාරගනු නොලැබේ.

14. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් සතුවේ.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම් එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

පද්මසිරි ජයමාන්න,
ලේකම්.

2019 පෙබරවාරි මස 18 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
''ඉසුරුපාය'', පැලවත්ත,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

*අධ්‍යාපන අමාත්‍යාංශය*

*දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල සිංහල හා දෙමළ මාධ්‍යය පාසල් ශිෂ්‍ය උපදේශන කාර්යය සඳහා අධ්‍යාපනවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 පන්තියේ **II** ශ්‍රේණියට බඳවා ගැනීම - 2019*

1.0 පුරප්පාඩුව සඳහා ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය සඳහා උපලේඛන 01 භාවිතා කර කේත අංකය යොදන්න.

භාෂා මාධ්‍යය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

2.0 පුරප්පාඩු සඳහා ඉල්ලුම් කිරීම :

2.1 පාසල් වර්ගය
(පාසල් වර්ගය උපලේඛන අංක 02 භාවිතා කර අදාළ කේත අංකය කොටුව තුළ ලියන්න.)

2.2 පළාත් පාසලක් නම් පළාතේ කේත අංකය
(පළාත් කේත අංකය උපලේඛන අංක 03 අනුව කොටුව තුළ ලියන්න.)

3.0 3.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (උදා. : AMARAKOON MUDIYANSELAGE NAMAL HERATH) :————.

3.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (උද. : HERATH A.M.N.) :————.

3.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

4.0 වර්තමාන ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

5.0

5.1 ජාතික හැඳුනුම්පත් අංකය :

5.2 විවාහක/අවිවාහක බව : අවිවාහක - 1 විවාහක - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

5.3 උපන් දිනය :

වර්ෂය මාසය දිනය

5.4 2019.04.12 දිනට වයස ඃ අවු. ඃ ☐☐ මාස ඃ ☐☐ දින ඃ ☐☐

5.5 ස්ත්‍රී/පුරුෂ භාවය (ස්ත්‍රී - 1, පුරුෂ - 0) (අදාළ අංකය කොටුව තුළ ලියන්න.) ☐

6.0 අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව විස්තර ඃ

| අ.පො.ස. (සා.පෙළ) විභාගය | | | | අ.පො.ස. (උ.පෙළ) විභාගය | |
|---|---|---|---|---|---|
| වර්ෂය :——. | විභාග අංකය :———. | | | වර්ෂය :——. | විභාග අංකය :———. |
| විෂයය | සාමාර්ථය | විෂයය | සාමර්ථය | විෂයය | සාමර්ථය |
| 1 | | 6 | | 1 | |
| 2 | | 7 | | 2 | |
| 3 | | 8 | | 3 | |
| 4 | | 9 | | 4 | |
| 5 | | 10 | | | |

7.0 උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව විස්තර ඃ

7.1 උපාධිය :————.
7.2 නිකුත් කළ විශ්වවිද්‍යාලය :————.
7.3 උපාධිය වලංගු දිනය :————.
7.4 උපාධියට හදුරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් :————.
7.5 උපාධිය ලබා ඇති මාධ්‍යය :————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. මා මෙම තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව නුසුදුසු බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත්වන බව ද දනිමි. මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................. මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ............... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරිගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

9.0 අයදුම්කරු රජයේ සේවකයකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

.......................................... මහතා/මහත්මිය/මෙනවියගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් සේවකයකු/සේවිකාවක වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ බලය පවරනු
ලැබූ නිලධාරියාගේ අත්සන.

දිනය :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

03-704

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචිකිරීමේ සහ පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

**(ISO තත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි)**

**නව පාඨමාලා - 2019**

ශ්‍රී ලංකාවේ මුද්‍රණ හා ග්‍රැෆික්ස් මාධ්‍ය ක්ෂේත්‍රයේ දැනුම, කුසලතාවය හා ප්‍රවීණතාවයේ උන්නතිය උදෙසා කැපවූ පුරෝගාමී වෘත්තීමය ආයතනයක් වූ ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය එම ක්ෂේත්‍රයේ නව තාක්ෂණික දියුණුව සහ කුසලතාවයන් වර්ධනය කිරීම උදෙසා 2019 වසරේ දී පහත සඳහන් නව අධ්‍යයන පාඨමාලා හඳුන්වාදෙනු ලබයි.

**නවතම 2018 වර්ෂයේ නිෂ්පාදිත වර්ණ 4 මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව**

**Training Programme on Modern Four Colour Offset Printing Machine Operation**
**(Heidelberg Speed Master 2018 Model)**

මෙම පාඨමාලාවේ අරමුණ වනුයේ නවීනතම සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර පිළිබඳව පුළුල් වපසරියක පුහුණුවක් ලබා දී ඒ තුළින් යන්ත්‍ර ස්වාධීනව ක්‍රියාකරවීමට සහ තත්වයෙන් උසස් ගුණාත්මක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සහභාගීවන්නවුන් පුහුණු කිරීම ය. සියලුම පුහුණු කරුවන්ට නවීනතම 2018 වර්ෂයේ නිෂ්පාදිත Heidelberg Speed Master Offset මුද්‍රණ යන්ත්‍රයක පුහුණුව ලබා දේ.

*පාඨමාලාවෙන් අධ්‍යයනය කෙරෙන කරුණු.-*

* යන්ත්‍රයේ නව උපාංග හා යන්ත්‍ර පරිගණකය භාවිතා කරන අන්දම සහ යන්ත්‍රය භාවිතය පිළිබඳව පූර්ණ දැනුම ලබාදීම ඇතුළුව දී ඇති කාලසීමාව තුළ දී තත්ත්වයෙන් උසස් හා නිරවද්‍ය ප්‍රතිඵල ලබා ගැනීමට යන්ත්‍රය සාර්ථකව සුසර කිරීම සහ ඵලදායීව ක්‍රියා කරවීමට පුහුණු කිරීම.

* මුද්‍රණ තත්ව පාලන ක්‍රම සහ උපකරණ භාවිතය පහදා දීම.

* සුළු කාර්මික දෝෂ අධ්‍යයනය කිරීම සහ ඒවා යථා තත්ත්වයට පත් කිරීම.

පාඨමාලා කාලය : මාස 03යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තු : රු. 25,000

එක් කණ්ඩායමකට 10 දෙනෙකි. සෙනසුරාදා සහ ඉරිදා 9.30 සිට 4.30 දක්වා කණ්ඩායම් 2 ක් පුහුණු කෙරේ.

විදේශ ගත මුද්‍රණ ක්ෂේත්‍රයන්හි රැකියා අපේක්ෂා කරන්නවුන් සඳහා මෙම පාඨමාලාව වඩාත් ඵලදායී වේ.

**ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

**Certificate Course on Digital Printing Technology**

මෙම පාඨමාලාවේ පරමාර්ථය වනුයේ ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබා දී ඒ තුළින් එම ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය පුළුල් තාක්ෂණික/ප්‍රායෝගික පුහුණුව සහ අවබෝධය ලබා දීමය.

*පාඨමාලාවෙන් අධ්‍යයනය කෙරෙන කරුණු.-*

* ඔබට ඔබගේ ආයතනයට සහ සමාජයට ඩිජිටල් මුද්‍රණය බලපාන අයුරු.
* විවිධාකාර ඩිජිටල් මුද්‍රණ තාක්ෂණයන් මුල සිට අග දක්වා අධ්‍යයනය කිරීම සහ එහි තාක්ෂණයන් භාවිතය පිළිබඳ පූර්ණ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා දීම, ඩිජිටල් මුද්‍රණ යන්ත්‍ර වර්ග අධ්‍යයනය.
* ඕෆ්සෙට් මුද්‍රණය වෙනුවට ඩිජිටල් මුද්‍රණය වාසිදායක ද? අවාසිදායක ද?
* ඩිජිටල් පෙර මුද්‍රණ සූදානම, ඩිජිටල් ෆයිල් සැකසුම සහ ඩිජිටල් ක්‍රියාදාමය පිළිබඳ අධ්‍යයනය.
* ඩිජිටල් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳ ප්‍රායෝගික වැඩමුළු.
* ඩිජිටල් මුද්‍රණ බැඳුම්කරණය (Digital Bindery) පිළිබඳ දැනුම ලබා දීම.

කාලය : මාස 04 (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 20,000

**මුද්‍රණ, ග්‍රැෆික්ස්, මුද්‍රණ ඇසුරුම් සහ ඩිජිටල් මාධ්‍ය ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන් සඳහා ව්‍යාපාර ඉංග්‍රීසි හා පෞරුෂත්ව වර්ධනය පිළිබඳ සහතිකපත් පාඨමාලාව**

**Business English and Personality Development for Printing, Graphics, Packaging & Digital Media Industry Personnel**

අද දියුණු වන ව්‍යාපාර ලොවට පිවිසෙන්නන්ට අවශ්‍යම අඩිතාලම වන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ හසල දැනුමක් සහ බුද්ධියක් ලබාදීමේ අරමුණින් ද ඒ හරහා තම පෞරුෂත්ව වර්ධනය කර ගැනීම පිළිබඳ පැහැදිලි පුහුණුවක්ද ලබාදීමේ අරමුණින් මෙම පාඨමාලාව සකස් කර ඇත.

කාලය : මාස 06 (අර්ධ කාලීන) පාඨමාලා ගාස්තුව : රු. 20,000

**මුද්‍රණ ඇසුරුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව**

**Diploma in Print Packaging Technology**

මෙම පාඨමාලාව තුළින් ඇසුරුම්කරණය පිළිබඳ මුල සිට අග දක්වා විස්තරාත්මකව දැනුම සහ පුහුණුව ලබා දේ. දැනුම පුළුල් වන අයුරින් ඇසුරුම් ආයතනවලට පුහුණුකරුවන් රැගෙන ගොස් විශේෂ දේශන පැවැත්වීම ද මෙම පාඨමාලාව අන්තර්ගතය තුළ සකසා ඇත.

මෙම පාඨමාලාව ඇසුරුම්කරණ ආයතනවල නියැලි පුද්ගලයින්ට මෙන්ම මෙම ක්ෂේත්‍රයට උනන්දුවන නවකයන්ටද සුදුසු අයුරින් සරලව අන්තර්ගතය සකස් කර ඇත.

කාලය - වසර 01 යි පාඨමාලා ගාස්තු රු. 40,000

පාඨමාලාවේ අන්තර්ගතය සඳහා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ වෙබ් අඩවිය වන www.sliop.edu.lk වෙත පිවිසෙන්න. නැත්නම් ආයතනයට පැමිණ සියලු කරුණු ඇතුළත් විස්තර පත්‍රිකාව ලබාගන්න.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ රැකියාවලට ගැලපෙන අයුරින් සකස්කොට ඇති අතර පාඨමාලා සාර්ථකව නිමකරන සිසුන් හට රජය හා ජාත්‍යන්තර පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීමේ සහ පුනරුත්ථාපන,
උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව - 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.

දුරකථන : 011-2686162, 011-2679791
ෆැක්ස් : 011-2686162
ඊමේල් : sliopreg@sltnet.lk
වෙබ් : www.sliop.edu.lk

ශාඛා :
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
මාතලේ.
දුරකථන අංක : 0662222172
0710554298

03-618

---

## ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

### මිනින්දෝරු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ලිතෝ තාක්ෂණ නිලධාරී තනතුර සඳහා (පුහුණු කිරීමේ ශ්‍රේණියට) බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2019

1.0 මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි, පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ලිතෝ තාක්ෂණ නිලධාරී තනතුර සඳහා පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීමට පැවැත්වෙන විවෘත තරඟ විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 *තනතුර නාමය* - ලිතෝ තාක්ෂණ නිලධාරී (පුහුණු කිරීමේ ශ්‍රේණිය)

1.2 *තනතුරෙහි රාජකාරි ස්වභාවය :*
* සිතියම් මුද්‍රණය හා දෙපාර්තමේන්තුවේ අනෙකුත් මුද්‍රණ කටයුතු කිරීම.

2.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් ගණනක් නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

3.0 *වැටුප :*

*වගුව - අංක 01-*

| *ශ්‍රේණිය* | *වැටුප් පරිමාණය* | *ආරම්භක මාසික වැටුප* |
|---|---|---|
| පුහුණු කිරීමේ ශ්‍රේණිය | නොමැත | 1 වසර මාසිකව රු. 21,532<br>2 වසර මාසිකව රු. 21,770<br>(රා.ප.ච.03/2016 හි උපලේඛන V විධිවිධාන අනුව) |
| III ශ්‍රේණිය | මාසිකව රු. 31,040 - 10 x 445 - 11 x 660-10x730 - 10 x 750- රු.57,550 (එම්එන් 3 - 2016) | රු. 24,626/-<br>(රා.ප.ච. 03/2016 හි උපලේඛන II විධිවිධාන අනුව) |

| *ශ්‍රේණිය* | *වැටුප් පරිමාණය* | *ආරම්භක මාසික වැටුප* |
|---|---|---|
| II ශ්‍රේණිය | මාසිකව රු. 31,040 x 10 x 445 - 11 x 660-10x730 - 10 x 750 - රු. 57,550 (12 වන වැටුප් පියවරෙන් ආරම්භ වේ.) (එම්එන් 3 - 2016) | රු. 28,684 (රා.ප.ව. 03/2016 හි උපලේඛන II විධිවිධාන අනුව) |
| I ශ්‍රේණිය | මාසිකව රු. 31,040 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 57,550 (23 වන වැටුප් පියවරෙන් ආරම්භ වේ). (එම්එන් 3 - 2016) | රු. 34,506 (රා.ප.ව. 03/2016 හි උපලේඛන II විධිවිධාන අනුව) |
| විශේෂ ශ්‍රේණිය | මාසිකව රු. 41,580 - 11 x 755 - 18 x 1,030- රු.68,425 (එම්එන් 7-2016) | රු. 32,960 (රා.ප.ව. 03/2016 හි උපලේඛන II විධිවිධාන අනුව) |

4.0 *තනතුරෙහි සේවා කොන්දේසි* :

4.1 පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගනු ලබන අයදුම්කරුවන් දෙවසරක පුහුණුව අවසානයේදී දියතලාව මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය මගින් පවත්වන යෝග්‍යතා පරීක්ෂණය සමත් වූ විට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ ලිතෝ තාක්ෂණ නිලධාරී තනතුරට බඳවා ගනු ලැබේ.

4.2 ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ ලිතෝ තාක්ෂණ නිලධාරී තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වන අතර, එම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

4.3 තෝරාගනු ලබන අයදුම්කරුවන් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පමණක් සේවය කිරීමට සූදානම්ව සිටිය යුතු ය. මෙම *ගැසට්* නිවේදනයේ ආරම්භයේ ඇති රාජ්‍ය සේවයට පත් කිරීමට අදාළවන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව හා එයට කලින් කලට කරනු ලබන සංශෝධන, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා රජය මගින් රාජ්‍ය සේවය පිළිබඳව නිකුත් කර ඇති හා කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලටද තෝරා ගනු ලබන්නා යටත් වේ.

4.4 රාජ්‍ය භාෂාව නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබාගත යුතුය.

4.5 ස්ථිර පත්වීමේ දින සිට වසර 05ක් ඇතුළත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තම තනතුරට අදළ වන මට්ටමේ දෙවන භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුවේ. අදළ කාලය තුළ එම ප්‍රවීණතාවය ලබා ගැනීමට අපොහොසත් වුවහොත් එම ප්‍රවීණතාව ලබා ගන්නා තුරු වැටුප් වර්ධක නතර කෙරේ.

4.6 III වන ශ්‍රේණියේ වසර 05ක් ඉක්මවීමට පෙර ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අ.පො.ස. (සා/පෙළ) සම්මාන මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා ගත යුතුය.

4.7 දෙවසරක පුහුණුව පූර්ණ වශයෙන් සම්පූර්ණ කරන බවට ද, දෙවසරක පුහුණුවෙන් පසු වසර 06ක් දෙපාර්තමේන්තුවේ සේවය කරන බවට ද, දෙපාර්තමේන්තුව සමග ගිවිසුමකට එළඹිය යුතු අතර, ඔහු/ඇය පුහුණුව ආරම්භක දිනයෙන් පසු පුහුණුව හැර ගියහොත් හෝ ගිවිසුම්ගත කාලය දෙපාර්තමේන්තුවේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් පුහුණුව සඳහා රජයට වැයවන මුදල වන රු. 1,50,000 ක මුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ගෙවන බවටද දෙපාර්තමේන්තුව විසින් පිළිගන්නා ඇපකරුවන් දෙදෙනකුගේ සහතික වීම සහිතව බැඳුම්කරයක් පුහුණුව ආරම්භ කිරීමට පෙර ලියා අත්සන් කළ යුතුය.

5.0 *සුදුසුකම්* :

5.1 (අ) *අධ්‍යාපන සුදුසුකම්* :

සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව යන විෂයන් දෙක (02) සහිතව විද්‍යා/ගණිත/තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත්වීම;

*සහ*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබීම.

5.2 *කායික සුදුසුකම් :*
සෑම අපේක්ෂකයෙකුම සිය තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

5.3 *වෙනත් :*
(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
(iv) සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාග යට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

6.0 *වයස :*

6.1 *අවම සීමාව :* අවුරුදු 18ට නොඅඩු
6.2 *උපරිම සීමාව :* අවුරුදු 30ට නොවැඩි

7.0 *පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේ ක්‍රමය :*

සර්වේයර් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

7.1 *ලිඛිත විභාගය :*

විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබෙන අතර, විභාගය කොළඹ දී පමණක් පැවැත්වේ.

| විෂයයන් | ලැබිය හැකි මුළු ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා ලැබිය යුතු අවම ලකුණු ප්‍රතිශතය | කාලය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% | පැය 01 |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% | පැය 02 |

7.1.1. *විෂය නිර්දේශය :*

(i) *බුද්ධි පරීක්ෂණය :*
අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

(ii) *තාක්ෂණ ප්‍රශ්න පත්‍රය :*

ගණිතය :

ත්‍රිකෝණමිතිය (සමීකරණ, ත්‍රිකෝණ විසඳීම)
සංඛ්‍යානය (මධ්‍යන්‍යය, මාතය, සම්මත අපගමනය, සම්භාවිතාව)
සම්භාවිතාව

භෞතික විද්‍යාව;
ආලෝකය හා ප්‍රකාශ විද්‍යාව (පරාවර්තනය සහ වර්තනය : දර්පන වක්‍ර පෘෂ්ඨ, ප්‍රිස්ම කාච ප්‍රකාශ විද්‍යාවේ සූත්‍ර)

විවිධ මාතෘකා ;
භූගෝල විද්‍යාව හැඳින්වීම (පෘථිවියේ හැඩය, භූ ලක්ෂණ ආදිය)
ඝණ වස්තුවල කෝණික දෘෂ්ටිය සහ ප්‍රක්ෂේපණ ව්‍යුත්පන්න කිරීම.

7.2 *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :*
සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා පමණක් සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

8.0 *පුහුණු කාලසීමාව අවසානයේ III ශ්‍රේණියට බඳවා ගැනීම :*

8.1 පුහුණු ශ්‍රේණිය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් දියතලාව මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය මගින් පවත්වන දෙවසරක, තාක්ෂණ ශිල්පී ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව එම ආයතනය මගින් පවත්වනු ලබන විභාගය සමත් බවට නිකුත් කරන සහතිකය ඉදිරිපත් කිරීමෙන් III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

8.2 පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත්වීමට අපොහොසත් වන ආධුනිකයන් වෙතොත් ඔවුනට මාස 06කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන ආධුනිකයින්ගේ තනතුර අවසන් කරනු ලැබේ.

9.0 *අයදුම්පත්‍ර සකස් කිරීම හා සම්පූර්ණ කිරීම :*

9.1 මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සෙ.මී. 21 x 29 (ඒ4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම් පත්‍රය සකස් කරගත යුතුය. අංක 01 සිට 02 දක්වා ශීර්ෂ 01 පිටුවෙහිද, අංක 03 සිට 09 දක්වා ශීර්ෂ 02 පිටුවෙහිද,

අංක 10 සිට 12 දක්වා ශීර්ෂ 03 පිටුවෙහිද ඇතුළත් වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතුය.

9.2 ඉල්ලුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් වන අතර භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ නොදෙන බැවින් නිවැරදිව සම්පූර්ණ කළ යුතුය.

9.3 සිංහලෙන් සහ දෙමළෙන් ඉදිරිපත් කරන අයදුම්පත්‍රවල ශීර්ෂයේ සඳහන් විභාගයේ නම එම භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

9.4 අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලය ලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කල තනතුරක් දරන නිලධාරියෙකු, හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

10.0 අයදුම්පත්‍ර භාර ගැනීම හා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම :

10.1 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය, නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

10.2 ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේදී අස්ථානගතවන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

10.3 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට සර්වේයර් ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම විභාග යට පෙනී සිටීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

11.0 විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු. 800 කි. මෙම මුදල කොළඹ 05, කිරුල පාර, අංක 150 ස්ථානයේ පිහිටි මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සරප් අංශයට හෝ ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට හෝ මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය - දියතලාව වෙත ගෙවා ලබාගත් රිසිට්පත අයදුම්පතෙහි ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ නොගැලවෙනසේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසා විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇනවුම් හෝ චෙක්පත් භාර ගනු නොලැබේ. රිසිට්පත් නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12.0 අයදුම්පත් යොමු කිරීම :

12.1 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2019.04.10 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
සර්වේයර් ජනරාල්,
විභාග අංශය,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
අංක 150,
නාරාහේන්පිට,
කොළඹ 05.

12.2 දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වුවන් ස්වකීය ආයතන ප්‍රධානීන් මගින් ද නියමිත දිනට හෝ ඉන් පෙර ඉදිරිපත් කල යුතුවේ.

12.3 අයදුම්පත බහා එවන කවරයේ වම්පස කෙළවරේ ''ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ ලිතෝ තාක්ෂණ නිලධාරි තනතුර සඳහා පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීම - විවෘත පදනම'' යනුවෙන් පැහැදිලිව සඳහන් කල යුතුය.

* *සැ. යු.*-2019.04.10 දිනෙන් පසුව මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත ලැබෙන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාර ගනු නොලැබේ.

13.0 සාවද්‍ය තොරතුරු සැපයීම :-

මෙම විභාගය සඳහා ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැතිබව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට

බඳවා ගත් පසුව වුවද අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් එය සාවද්‍ය බව දූන දූනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන් කර ඇති බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

14.0 *විභාගයට පෙනී සිටීම* :

14.1 විභාග අපේක්ෂකයින් විභාගයට පෙනී සිටීමට ප්‍රථම ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගත යුතුය. විභාග මධ්‍යස්ථානයේදී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඔබට අවසර නොලැබෙනු ඇත. තවද අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේදී විභාග යට පෙනී සිටිය යුතුය.

15.0 *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය* :

විභාග ශාලාවේදී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

16.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සර්වේයර් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

පී. එම්. පී. උදයකාන්ත,
සර්වේයර් ජනරාල්.

2019 මාර්තු මස 06 වැනි දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**ආදර්ශ අයදුම් පත්‍රය**

ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

**මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ලිතෝ තාක්ෂණ නිලධාරී තනතුර සඳහා (පුහුණු කිරීමේ ශ්‍රේණියට) බඳවා ගැනීමේ විවෘත තරග විභාගය-2019

Open Competitive Examination for recruitment to the Post of Litho Technical Officer (to the Training Grade) - 2019

ආදර්ශ අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද ඇතුළත් කළ යුතු ය.

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) [ ]

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : PERERA,A.B.C.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය: | | | | | | | | | | | | |

1.5 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

1.6 2019.04.10 වැනි දිනට වයස : අවු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

1.7 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1
පුරුෂ - 2 ☐
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

1.8 විවාහක/අවිවාහක බව : විවාහක ☐ අවිවාහක ☐

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.4 දුරකථන අංකය(තිබේනම්) :————.

3.0 3.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
3.3 ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

4.0 අධ්‍යාපන සුදුසුකම් : (අදාළ සහතිකවල සහතික කළ පිටපත් ඇමිණිය යුතුය)
4.1 අ.පො.ස (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1.<br>2.<br>3.<br>4.<br>5. | | 6.<br>7.<br>8.<br>9.<br>10. | |

4.2 අ.පො.ස (උ. පෙළ) විභාගය පිළිබඳ විස්තර :
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1.<br>2. | | 3.<br>4. | |

5.0 වෘත්තීය/තාක්ෂණික සුදුසුකම් : (අදාළ සහතිකවල සහතික කළ පිටපත් ඇමිණිය යුතුය.)
5.1 හදාරා ඇති උපාධිය/ පාඨමාලාව :————.
5.2 උපාධිය/ පාඨමාලාව හැදෑරූ ආයතනයේ නම :————.
5.3 උපාධියේ/ පාඨමාලාවේ කාලය :————.

6.0 වෙනත් සුදුසුකම් ：

........................................................................................................................

........................................................................................................................

7.0 ඔබ කවරදාක හෝ යම්කිසි චෝදනාවක් සඳහා උසාවියකින් වැරදිකරු කරනු ලැබ තිබේද? (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

7.1 ''ඔව්'' නම් විස්තර සඳහන් කරන්න :————.

8.0 අයදුම්කරු මීට පෙර රජයේ/පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කර ඉවත් වී සිටින අයෙක් නම් එසේ ඉවත්වීමට හේතුව :————.

9.0 විභාග ගාස්තු ගෙවීම් පිළිබඳ විස්තර ：

9.1 විභාග ගාස්තුව ගෙවන ලද කාර්යාලය :————.

9.2 ලදුපත් අංකය හා දිනය :————.

9.3 ගෙවූ මුදල ： රු. :————.

| |
|---|
| විභාග ගාස්තු ගෙවූ ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න.) |

10.0 අයදුම්කරුගේ සහතිකය ：

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වේ. තවද, මෙහි සියලු කොටස් සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරනලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව ද පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද, ප්‍රකාශ කර සිටිමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ：

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................මයා/මිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ............... දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, මම සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාව තබා සනාථ කළ යුතුයි.)

12.0 දැනටමත් රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවය කරන නිලධාරීන් සඳහා පමණක් අදාළ වේ. දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති .................. මයා/මිය/මෙය .................. දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ............දින සිට ............ දින දක්වා ............ වශයෙන් සේවය කරන අතර, ඔහුට/ඇයට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී ඇත/නැත. ඔහුගේ/ඇයගේ වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදයක/අසතුටුදායක ය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය .................. තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන්/ආයතනයෙන් මුදා හැරීමට හැකි/නොහැකි බව දන්වනු කැමැත්තෙමි.

________,
දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ අත්සන.

03-977

---

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2018(2019)

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරෙහි II ශ්‍රේණියට සුදුස්සන් 98 දෙනෙක් බඳවා ගැනීම සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන විවෘත තරග විභාගයට අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය 2019 ජුනි මස කොළඹ දී පමණක් පවත්වනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පමණක් පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ ඊට පෙර ''විභාග කොමසාරිස් ජනරාල්'', සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එදිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ ''සංඛ්‍යාලේඛන නිලධාරි II ශ්‍රේණියට සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. විභාගයේ නම සිංහල/දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද ''Open Competitve Examination for Recruitment of Officers to Grade II of the Post of Statistical Officer'' ලෙස සඳහන් කළ යුතුය.

අයදුම්පත් කැඳවන අවසාන දිනය 2019.04.12 වැනි දින වේ.

*සටහන* : ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර එවීම ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(02) *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) 2009.02.20 දිනැති අංක 1589/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 2 නිලධර ගණය (සංඛ්‍යාලේඛන නිලධාරි) සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධානවලට හා එම බඳවා ගැනීමේ පරිපාටියට මින් මතු සිදු කරනු ලැබිය හැකි සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අයදුම්කරුවන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරෙහි II ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ii) *වැටුප් පරිමාණය*.-2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන 1 ට අනුව MN-5-2016 හි රු. 34,605 - 10 x 660 - 11 x 755 - 15 x 930- රු. 63,460 ක (මාසික) වැටුප් පරිමාණයක් මෙම තනතුරට හිමි වේ. 2020.01.01 දින දක්වා එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව වැටුප් ගෙවනු ලබයි.

(iii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුරට පත්කරනු ලබන්නන් ඔවුන්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුවේ. තව ද, ඔවුන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔවුන් විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(iv) මෙම තනතුරට පත්කරනු ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

(v) සංඛ්‍යාලේඛන නිලධාරීන් II ශ්‍රේණියට පත්වී වසර තුනක් (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(vi) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 අනුව හා ඊට අනුෂාංගික රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවයට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ තනතුරට අදාළ වන ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබාගත යුතුය.

(vii) මෙම *ගැසට් පත්‍රයේ* I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදය ආරම්භයේ පළකර ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත්කිරීම්වලට අදාළ පොදු කොන්දේසිවලට ද අයදුම්කරුවන්ගේ අවධානය යොමු කෙරේ.

(03) *යෝග්‍යතාව.-*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු අතර 2009.02.20 දිනැති අංක 1589/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල V පරිච්ඡේදයේ සඳහන් එකඳු හෝ නුසුදුසුමකින් පෙළෙන්නෙක් නොවිය යුතුය.

(iii) *වයස.*-අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා 35ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 1998.04.12 දිනට හෝ ඊට පෙර හා 1984.04.12 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

(iv) *කායික සුදුසුකම්.-*

(i) සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

(ii) තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත අය විය යුතුය.

(v) *අධ්‍යාපන සුදුසුකම්.*-සංඛ්‍යානය, ගණිතය, ආර්ථික විද්‍යාව, පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය, ප්‍රජා විද්‍යාව, භූගෝල විද්‍යාව, සමාජ විද්‍යාව යන විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක් අන්තර්ගත වූ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලැබූ උපාධියක් තිබිය යුතුය.

*සටහන.*-අයදුම්කරුවන් මෙම තනතුරට බඳවා ගනු ලැබීම සඳහා මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

(04) *තෝරා ගැනීමේ ක්‍රමය.-*

බඳවා ගැනීමේ විභාගයෙන් සමත් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුගේ සිට පහළට එම විභාගයේ ලකුණුවල අනුපිළිවෙළ අනුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පිරවීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කරගෙන තීරණය කරනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී එසේ කැඳවනු ලබන අයදුම්කරුවන්ගේ මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් පරීක්ෂා කරනු ලබන අතර ලකුණු ලබාදීමක් සිදු නොවේ. අයදුම්කරුවන්ගේ සුදුසුකම් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී තහවුරු කරගත් පසු ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුවම පමණක් තෝරාගනු ලබන අයදුම්කරුවන් පුරප්පාඩු තනතුරුවලට පත්කරනු ඇත. පවතින පුරප්පාඩු සියල්ල හෝ ඉන් කොටසක් නොපුරවා සිටීමේ බලය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුය.

(සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගයේ විෂය නිර්දේශය අංක 05.II යටතේ දැක්වේ.)

(05) *විභාග පටිපාටිය.-*

(i) විභාගයේ විෂයන්, පිළිතුරු සැපයීමේ මාධ්‍ය හා සමත් ලකුණු :

බඳවා ගැනීමේ විභාගය පහත සඳහන් විෂයයන් යටතේ වූ ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත ලිඛිත විභාගයකි. විභාගයෙන් සමත් වීමට අවම වශයෙන් එක් විෂයකින් ලකුණු 40% ක් ලබා තිබිය යුතුය. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අයදුම්කරුවකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

(අ) බුද්ධි පරීක්ෂණය
(ආ) සාමාන්‍ය දැනීම

(ii) විෂය නිර්දේශය :-

(අ) *බුද්ධි පරීක්ෂණය.*-කාලය පැය 1 යි, මුළු ලකුණු 100 යි. අයදුම්කරුවන්ගේ තර්කන ශක්තිය මැන බැලීම සඳහා අරමුණු කළ ප්‍රශ්න පත්‍රයකි. බහුවරණ මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විතය. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය.

(ආ) *සාමාන්‍ය දැනීම* - කාලය පැය 01යි. මුළු ලකුණු 100 යි. ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් කාලීන සිදුවීම්, නව විද්‍යාත්මක හා තාක්ෂණික සොයා ගැනීම් පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම මැන බැලීම සඳහා අරමුණු කළ ප්‍රශ්න පත්‍රයකි. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විතය. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය.

(iii) විභාගයට පිළිතුරු ලිවීම සඳහා ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(iv) විභාගයට පෙනී සිටීමට අයදුම්කර ඇති අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර එවනු ලැබේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝණය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(v) විභාගය කල්දැමීම හෝ අවලංගු කිරීමේ බලය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුය.

06. *විභාගයට අයදුම් කිරීමේ පිළිවෙල* :-

(i) අයදුම්පත සෙ. මී. 22 x 29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කර ගත යුතු අතර, 1 සිට 6 තෙක් ශීර්ෂ පළමුවන පිටුවටද, 7 සිට 13 වන තෙක් ශීර්ෂ දෙවන පිටුවටද, ඉතිරිය 3 සහ 4 පිටුවටද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර, ඉල්ලා ඇති තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, යොමු කරන ලද අයදුම්පතෙහි ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූලද යන්න පිළිබඳ අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බව වැඩිදුරටත් දන්වමි.

(ii) විභාග ගාස්තුව රු. 1,200.00 කි. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට හෝ දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබා ගන්නා ලදුපත එහි දාරයකින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙනසේ ඇලවිය යුතුය. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ද, අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) විභාග ගාස්තු සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මරු කිරීමක් සිදු නොකරනු ඇත.

(iv) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත අයදුම්කරුවන් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය. දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් වුවද අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පසුව ලැබුනහොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(v) *අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :- සෑම අයදුම්කරුවෙක්ම අයදුම්පතේ තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වේ. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත අයදුම්කරුවන් තමන්ගේ අත්සන අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා ලවා සහතික කරවා ගත යුතුය. එසේ අත්සන සහතික කිරීමේදී දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව තැබිය යුතුය. නොමැති නම් අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. එසේ නොවන අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්-වරයෙකු, රජයේ නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්-වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කර ගත යුතුය.

07. (i) *විභාග ප්‍රවේශ පත්‍රය* :

මෙම නිවේදනයේ සඳහන් සියලු සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් විභාගය සඳහා අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කර ඇති හා අයදුම්පත් භාර ගැනීමේ අවසන් දින හෝ ඊට පෙර ලැබෙන ලෙස තම අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේනය පළ වී දින දෙකක් හෝ තුනක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම්, එසේ පළකරනු ලබන දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. අයදුම්කරුවන් තමන්ගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම්කළ විභාගයේ නම ද විභාග දෙපාර්තමේන්තුවට දැන්විය යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමඟ ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි වන අයුරින් ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත්

අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) අයදුම්පතේ ද, විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුවන්ගේ අත්සන සහතික කර තිබිය යුතු අතර, අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේ ම විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ.

(iii) අයදුම්පත් ලැබුණු බව අයදුම්කරුට දන්වනු නොලැබේ.

(08) *අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය* :-
විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අයදුම්කරුවෙකුම විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
iii. වලංගු රියදුරු බලපත්‍රය.

(09) ලිඛිත පරීක්ෂණයෙන් තෝරා ගනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කිරීමට සූදානම්ව තබා ගත යුතුය.

(i) උප්පැන්න සහතිකය,
(ii) උපාධි සහ අනෙකුත් අධ්‍යාපන සහතික,
(iii) පාසල හැරයාමේ සහතිකය (හෝ වගකිව යුතු පුද්ගලයකු වෙතින් මෑතකදී ලබාගත් යහපත් චරිතය පිළිබඳ සහතිකයක්) සහ විශ්ව විද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ස්ථිර තනතුරක් දරන කථිකාචාර්යවරයෙකුගේ හෝ ඊට ඉහළ නිලධරයකුගෙන් ලබාගත් චරිත සහතිකයක් (දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන්නන් මෙම සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.)
(iv) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික (ඇතොත්)
(v) සිංහල/දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

*සැලකිය යුතුය* :

(a) මුදල් ගෙවූ ලදුපත හැර අන් කිසිම ලියවිල්ලක් හෝ පිටපතක් අයදුම්පතට නොඇමිණිය යුතුය.
(b) කෙසේ වුවද මෙම තනතුර සඳහා ස්වකීය යෝග්‍යතාව සනාථ කිරීමට අවශ්‍ය ලියකියවිලි ඉල්ලූ අවස්ථාවකදී ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් මෙම තනතුරට පත් කරනු ලැබීමට සලකා බලනු නොලැබේ.

10. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අයදුම්කරුවෙකුට ඊට පෙනී සිටීමට සුදුසුකම් නොමැති බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව හෝ එය පැවැත්වෙන අතරතුර හෝ ඉන් පසුව කවර හෝ අවස්ථාවකදී වුවද එම අයදුම්කරුගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අයදුම්කරු විසින් දුන දූනම සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවක් හෝ කිසියම් අදාළ කරුණක් දුන දූනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත් අයදුම්කරු මෙම විභාග යට පෙනී සිටීමට නුසුදුස්සකුව සිටි බව එකී අයදුම්කරුගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක දී හෝ සනාථ වුවහොත්, එයම ඔහු/ඇය වහාම සේවයෙන් පහ කරනු ලැබීමට හේතු වනු ඇත. තව ද, මෙම නිවේදනයේ සඳහන් අවශ්‍යතා සපුරා නොමැති අයදුම්කරුවන්ගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(11) මෙම බඳවා ගැනීමට අදාළ වන සහ මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති ඕනෑම කරුණක් පිළිබඳව තීරණය කිරීම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කරනු ඇත.

12. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාදයන් අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් හෝ පවතී නම්, සිංහල නිවේදනයේ සඳහන් කරුණු බලපැවැත්වේ.

අයි. ආර්. බණ්ඩාර,
අධ්‍යක්ෂ ජනරාල්,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.

**ආදර්ශ අයදුම්පත**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරෙහි II ශ්‍රේණියට
බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2018 (2019)

Open Competitive Examination for Recruitment to the post of Statistical Officer - Grade II in the Department of Census and Statistics - (2018) 2019

විභාග අංකය :- [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත මාධ්‍ය
(සිංහල-2/දෙමළ-3/ඉංග්‍රීසි-4) [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 සම්පූර්ණ නම :——————————————.
(සිංහලෙන්/දෙමළෙන්)

02. 2.1 ස්ථිර ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය :—————.

ස්ත්‍රී - 1
පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය :-

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

04. ජාතික හැඳුනුම්පත් අංකය :- ☐☐☐☐☐☐☐☐☐☐☐☐

05. ජංගම දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

ස්ථාවර දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

06. ජනවර්ගය : ( අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න)

| | | | |
|---|---|---|---|
| සිංහල | | ඉන්දියානු දෙමළ | |
| ශ්‍රී ලංකා දෙමළ | | මැලේ | |
| මුස්ලිම් | | වෙනත් | |

07. පදිංචි දිස්ත්‍රික්කය :—————.
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :—————.

08. ගෙවන ලද ගාස්තුව (කුවිතාන්සියේ ඡායා පිටපත් අයදුම්කරු තබා ගන්නේනම් මැනවි)
මුදල් ගෙවන ලද දිනය :—————.
මුදල :—————.
තැපැල්/උප තැපැල්, දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :—————.
ලදුපත් අංකය :—————.

*කුවිතාන්සිය නොගැලවෙන සේ එහි දාරයක් මෙහි අලවන්න.*

09. එක් එක් භාෂා විෂයන්ගෙන් ලබා ඇති ඉහළම සාමර්ථය :- (විභාගයේ නම සඳහන් කරන්න)
සිංහල :—————.
දෙමළ :—————.
ඉංග්‍රීසි :—————.

10. අධ්‍යාපන සුදුසුකම් :-

උපාධිය පිළිබඳ විස්තරය :

| උපාධිය | ආයතනය | සාමාර්ථය | විෂයයන් | වලංගු දිනය |
|---|---|---|---|---|
| | | | | |

වෙනත් අධ්‍යාපන සුදුසුකම් :

| පාඨමාලාව | ආයතනය | විෂයය විස්තරය |
|---|---|---|
| | | |

11. වෙනත් සුදුසුකම් :..............................................................................................
.............................................................................................................. ...

12. දැනට නිරත රැකියාව හා ඊට ප්‍රථමයෙන් කරන ලද රැකියාවන් :

| ආයතනය | තනතුර | සිට | දක්වා | වැටුප (මාසික) |
|---|---|---|---|---|
| | | | | |

13. ඔබ සාපරාධී වරදකට උසාවියක දී චෝදනා ලැබූවෙක් ද ? එසේ නම් ඒ විස්තරය සඳහන් කරන්න. :

..................................................................................................................
..................................................................................................................

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, ඒවා බවට සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව,මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැන ගත හොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් දැන සිටිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

_________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :_________.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...................................මයා / මිය / මෙනවිය මා පෞද්ගලිකව දන්නා බවත්, මුදල් ගෙවන ලදුපත අලවා ඇති බවත්, මා ඉදිරියේ දී ඔහුගේ /ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

_______________,
අත්සන සහතික කරන ලද නිලධාරියාගේ අත්සන.

නම :_______________.
පදවි නාමය :_______________.
ලිපිනය :_______________.
දිනය :_______________.

- අයදුම්කරුගේ අත්සන සහතික කිරීම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 06 (V) ඡේදයේ සඳහන් පරිදි විය යුතුය.
- අයදුම්කරු රජයේ දෙපාර්තමේන්තුවක / ආයතනයක සේවය කරන්නේ නම් පහත සඳහන් සහතිකය සමග සිය දෙපාර්තමේන්තු හෝ ආයතන ප්‍රධානියා මාර්ගයෙන් අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

...................................................... මහතා / මහත්මිය /මෙය දැනට මෙම දෙපාර්තමේන්තුවේ .................................... වශයෙන් ස්ථිර / තාවකාලික /අනියම් නිලධාරියෙකු / නිලධාරිනියක ලෙස සේවය කරයි. ඔහු / ඇය (අවවාද කිරීමක් හැර) කිසිදු විනය දඬුවමකට ලක් වී නැති බවත් ,මෙම අයදුම්පතේ සපයා ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි. ඔහුගේ /ඇයගේ හැසිරීම හා වැඩ සතුටුදායක බවත්, අදාළ *ගැසට්* නිවේදනය ප්‍රකාරව ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමේ සුදුසුකම් සපුරා ඇති බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් මෙයින් සහතික කරමි.

තෝරාගනු ලැබුවහොත් ඔහු /ඇය සේවයෙන් මුදාහැරිය හැකිය./ නොහැකිය.

_______________,
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :_______________.
පදවි නාමය :_______________.
ලිපිනය :_______________.
දිනය :_______________.

03-1039

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.